රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 21/94

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1994.06.15 වැනි දින.

සියළුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
දිසාපතිවරුන් වෙත.

## මැතිවරණ වලට තරග කිරීම පිණිස සේවයෙන්
## ඉල්ලා අස්වූ ග්‍රාම නිලධාරීන්

මැතිවරණ වලට තරග කිරීම සඳහා සිය තනතුරෙන් ඉල්ලා අස්වූ ග්‍රාම නිලධාරියෙකු ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් වලට අනුකූලව ගැලපෙන සුදුසු තනතුරක් සඳහා සලකා බැලීම පිණිස සංචිතයට අන්තර්ග්‍රහණය කළ යුතුය.

02. තවද එබඳු නිලධරයකුට දස වසරක විශ්‍රාම වැටුප් සහිත සේවා කාලය සම්පූර්ණ කරනු හැකිවනු පිණිස වයස 60 සීමාවේ උපරිමයට යටත්ව සේවා දීර්ඝ කිරීම් ලබා දිය යුතුය.

03. මින් ඉදිරියට ග්‍රාම නිලධරයෙකු මැතිවරණයකට තරග කිරීම සඳහා ඉල්ලා අස්වුවහොත් ඔහු රාජ්‍ය අංශයේ තනතුරකට හිමිකම් නොලබයි. මේ බව ඔහුගේ පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කළ යුතුය

අ.කලේ/(වයි.බී.පුස්සෙදෙණිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.